# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1860/11 - 2014 අප්‍රේල් මස 30 වැනි බදාදා - 2014.04.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාවේ සභිකධූරයේ පුරප්පාඩුව පිරවීම

අවසරය ලබා නොගෙන මාස තුනක කාලසීමාවක් සභාවේ රැස්වීම් වලට සහභාගී නොවීම හේතු කොට ගෙන වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

වසන්තනාතන් සිවනාතන් නම් වූ සභිකයා අයත් වන ඉලංකෙයි තමිල් අරසු කච්චි නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත්, ඒ වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත් වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී, ආඥාපනතේ 65අ (2) වැනි වගන්තිය යටතේ, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නිශ්චිත කාල පරිච්ජේදය ඇතුළත නාමයෝජනා නොකරනු ලැබ ඇති හෙයින් ද ;

වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී පොන්නුතුරෙයි කුගනාතන් වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත. (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ (2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, 2011 ජූලි මස 23 වැනි දින වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව සඳහා පැවැත්වූ ඡන්ද විමසීමේදී තෝරා පත්කර ගත් අවසාන සභිකයා ලඟට වැඩිම මනාප සංඛ්‍යාව ලබාගත් ආරුමුකම් තෙයිවේන්තිරම් මහතා වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

පී. කුගනාතන්,<br>
තේරීම්භාර නිලධාරී,<br>
වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව.

2014 මාර්තු මස 18 වැනි දින,<br>
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,<br>
යාපනය.

05 - 429

1A - G 019480 — 90 (2014/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ මුලටියන ප්‍රාදේශීය සභාවේ සභිකධුරයේ පුරප්පාඩුව පිරවීම**

ඉල්ලා අස්වීම හේතු කොට ගෙන මුලටියන ප්‍රාදේශීය සභාවේ සභිකධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

මීගහලන්ද දූරගේ වරුණදේව නම් වූ සභිකයා අයත් වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත්, ඒ මුලටියන ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත් වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී, ආඥාපනතේ 65අ (2) වැනි වගන්තිය යටතේ, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන ගංහේවාගේ මර්තේනිස් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

මුලටියන ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී වේවැල්වල හේවගේ රවින්ද්‍ර විජය කුමාර වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත. (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ (2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ගංහේවාගේ මර්තේනිස් මහතා මුලටියන ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඩබ්. එච්. ආර්. විජය කුමාර,
තේරීම්භාර නිලධාරී,
මුලටියන ප්‍රාදේශීය සභාව.

2014 අප්‍රේල් මස 23 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
මාතර.

05 - 430

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.